**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය - 2015**

**------------------------------------------------------------**

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 76 , 1987 අංක 05 හා 2003 අංක 38 දරන පනත් මගින් සංශෝධිත 1979 අංක 45 දරන ජාතික වැව්ලි කළමනාකරණ පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැතියන් 19 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.5,913,020 ක් අතුරින් වසරකට වඩා හිඟව පැවති වටිනාකම රු.345,486 ක් විය.

**(ආ)** සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතනය විසින් ණයහිමියන් 11 දෙනෙකු සඳහා රු.10,793,165 ක් ගෙවිය යුතුව පැවති අතර එයින් වසර දෙකකට වඩා පැරණි ණය ශේෂවල වටිනාකම රු.4,931,400 ක් විය.

## 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | මුදල් ඇමතිවරයාගේ හා අදාළ අමාත්‍යාවරයාගේ අනුමැතියකින් තොරව එකතුව රු. 12,566,077 ක් කාලීන තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ඡේදය | එකතු කළ අගය මත බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 දින හෝ ඊට පෙර එම ගෙවීම් පිළිබඳ විස්තරයක් විගණකාධිපති වෙත යොමුකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 ඡේදය | සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 632,438 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,833,579 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,466,017 ක වර්ධනයක් විය. සේවක පාරිශ්‍රමික රු.11,454,650 කින් වැඩිවී තිබුණද පුහුණු කිරීම් ආදායම් රු.7,972,853 කින්, රජයේ පුනරාවර්ථන ප්‍රදාන රු.3,710,000 කින් හා විලම්භිත ප්‍රාග්ධන ප්‍රදාන රු.2,235,102 කින් වැඩිවී තිබීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011, 2012 හා 2014 වර්ෂවල මූල්‍ය ඌනතාවයක් පැවතියද 2013 හා 2015 වර්ෂවලදී මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තයක් ඇති වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය සැලකීමේදී 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම දායකත්වය ධන අගයක් ගෙන තිබුණ අතර 2013 දක්වා එය අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එහෙත් 2014 වර්ෂයේදී එය සුළු වශයෙන් පිරිහී තිබුණද නැවත 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 35 කින් වැඩි වී තිබුණි.

### 3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

----------------------------------------------------------

ව්‍යාජ ලෙස සකස් කරන ලද අධ්‍යාපන සහතික ඉදිරිපත් කිරීම හේතුවෙන් සේවයෙන් ඉවත් කරන ලද සේවකයෙකු කූඨ ලේඛන සකස් කිරීමේ වරදට අධිකරණය මගින් වරදකරුවකු කර තිබුණි. එසේ වුවද එම සේවකයා විසින් වන්දියක් ඉල්ලා ආයතනයට එරෙහිව කම්කරු උසාවියේ නඩුවක් ගොනුකිරීම පදනම් කරගෙන ආයතනය විසින් රු.3,765,757 ක් අසම්භාව්‍ය බැරකම් වශයෙන් ගිණුම්වල ප්‍රතිපාදනය කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

1979 අංක 45 දරණ වැවිලි කළමනාකරණ පනත අනුව ආයතනයේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

- වැවිලි සේවයේ නියුක්ත සියලු වර්ගවලට අයත් සේවා නියුක්තයන්ට ආයතනය විසින් ම හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඇති වෙනත් ආයතන සම්බන්ධව වැවිලි කළමනාකරණයට අදාල පුහුණුවීමේ පහසුකම් සහ පුහුණුවීමේ පාඨමාලා සැපයීම.

- සේවයෙහි යෙදී සිටින සේවා නියුක්තයන්ට වැවිලි කළමනාකරණය පිළිබඳ සංස්කරණ සම්මේලන සහ තත්ත්වානුකූලකරණ පාඨමාලා සංවිධානය කිරීම.

- රාජ්‍ය අංශයෙහි මෙන් ම පෞද්ගලික අංශයෙහි වැවිලි ක්ෂේත්‍රයේ සේවයේ නියුතු සේවක පිරිස් සඳහා වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව සැලසීම.

- තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය, පොල් පර්යේෂණ ආයතනය සහ එබඳු වෙනත් ආයතනයන් හා සම්බන්ධව ඩිප්ලෝමා පාඨමාලා සංවිධානය කිරීම සහ යෝග්‍ය අවස්ථාවලදී ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.

- වැවිලි කළමනාකරණය හා සංවර්ධනය සම්බන්ධ වූ සම්මන්ත්‍රණ හා කාර්ය සැසි සංවිධානය කිරීම හා පැවැත්වීම සහ සඟරා කලාප පළ කිරීම සහ

- වෙනත් සමාන ආයතන වලින් දැනටමත් විධිවිධාන සලස්වා නොමැති, වැවිලි කළමනාකරණය සහ කම්කරු සම්බන්ධතා ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 වර්ෂයේදී ආරම්භ කරන ලද විද්‍යාවේදී (වැවිලි කළමනාකරණ) බාහිර උපාධි පාඨමාලාව සම්බන්ධයෙන් ආයතනය හා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. දැනට මෙම උපාධි පාඨමාලාව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන අතර උපාධි සහතිකය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ නම ඒ සඳහා භාවිතා කරනු ලැබේ. ඒ අනුව මෙම උපාධි පාඨමාලාව වෙනුවෙන් ගිවිසුමක් නොතිබීම නිසා ආයතනයට කිසිදු ආදායමක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ආයතනය විසින් දැනට පවත්වනු ලබන අධ්‍යාපන හා වෘත්තීය පාඨමාලා, තාක්ෂණික හා කළමනාකරණ සංවර්ධන වැඩ සටහන්, කුසලතා සංවර්ධන වැඩ සටහන්, පදනම් පාඨමාලා ආදිය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකයක් ලබා නොදීම නිසා එයට සහභාගිවන අයට ලැබෙන සහතිකයේ අගය අඩුවී තිබුණි.

(ඇ) ජාතික වැවිලි කළමනාකරණ ආයතනයට අයත් තක්සේරු වටිනාකම වූ රු. 55,000,000 ක්වූ අක්කර 04 රූඩ් 03 පර්චස් 05.90 ක් වූ භූමි ප්‍රමාණයක් 2014 දෙසැම්බර් 15 දින ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත භාර දී තිබුණද 2016 ජූනි මාසය දක්වා ඒ සඳහා කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

## 4.3 හඳුනා ගන්නා ලද පාඩු

------------------------

අවශ්‍යතාවය පිළිබඳ නිසි අධ්‍යයනයකින් තොරව මිලදී ගැනීම නිසා රු.229,840 ක් වටිනා Exterior Water based Lacquer ලීටර් 104 ක් කල් ඉකුත්වී තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත අයදුම්කරුවෙකු පුහුණු නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට තෝරාගෙන පත්වීමේ ලිපියක් යවා තිබුණද අයදුම්කරු සේවයට වාර්තා නොකිරීම නිසා එම තනතුර පුරප්පාඩුව පැවති අතර නැවත 2015 වර්ෂයේදී ද රු.71,761 ක් වියදම් දරා පුවත්පත් දැන්වීම පළකර තිබුණද බඳවාගැනීම් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන නිලධාරී හා මුද්‍රණ සහකාර තනතුරු දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පැවති අතර බඳවා ගැනීමට කිසිදු වැඩපිළිවෙලක් යොදා නොතිබුණි.

(ඇ) ආයතනයේ ඉදිකිරීම්, කොන්ත්‍රාත් සම්බන්ධ ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා සුදුසුකම් ලත් තාක්ෂණික නිලධාරියෙකු නොමැති නිසා පිළියෙල කර තිබූ ඇස්තමේන්තුවල සැලකිය යුතු ප්‍රමාණයේ වෙනස්කම් තිබුණි.

(ඈ) වැඩ පරීක්ෂක තනතුර සඳහා තෝරාගත් පුද්ගලයකු විසින් ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයෙහි හා විභාග ප්‍රතිඵල සහතිකයෙහි තොරතුරු පරස්පර විය. එසේ තිබියදී ඒ පිළිබඳව ක්‍රියාමාර්ග නොගෙන පසුව එම නිලධාරියා කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවකයෙකු ලෙස බඳවාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

------------------------------------------

### 5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන් 70 ක් සැලසුම් කර තිබුණද 41 ක් පවත්වා නොතිබූ බැවින් වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය සියයට 41ක් විය.

(ආ) පරිගණක ඒකකය තුළ 2015 වර්ෂයේ නොවැම්බර් මාසය වන විට පවත්වා තිබූ මුළු වැඩසටහන් සංඛ්‍යාව 5 ක් පමණි. එසේ වුවද, රු. 1,378,040 ක වියදමක් දරමින් පරිගණක යන්ත්‍ර 12 ක් හා ඊට අදාල උපාංග 2015 නොවැම්බර් 30 දින මිලදී ගෙන තිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

-------------------------

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් ආයතනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩුව පවතින තනතුරු සඳහා අදාළ නිලධාරීන් කඩිනමින් බඳවා ගැනීමට කටයුතු නොකිරීම සහ බඳවාගත් නිලධාරීන්ගේ අධ්‍යාපන සුදුසුකම් වලට අදාල ප්‍රතිඵල සනාථ කර ගැනීමට කටයුතු නොකිරීම. |

| | | |
|---|---|---|
| (ආ) | මෙහෙයුම් පාලනය | ආයතනය විසින් දැනට පවත්වනු ලබන අධ්‍යාපන හා වෘත්තීය පාඨමාලා, සහ සංවර්ධන වැඩ සටහන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතිකයක් ලබා දීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ගිණුම්කරණය | සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණය කර එම ප්‍රතිපත්ති ගිණුම්වල හෙළිදරව්කර ඒ අනුව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු නොකිරීම. |